බස්නාහිර පළාතේ චක්‍රලේඛ අංක 4/96

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1996.07.22.

බස්නාහිර පළාතේ සියළුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත.

## බස්නාහිර පළාතේ සමුපකාර සේවක වැටුප් ප්‍රතිශෝධනය - 1996

ඉහත කාරණයට අදාලව ම විසින් නිකුත් කරන ලද අංක 2/96 සහ 96.06.27 දින චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී යම් විෂමතාවයක් පැන නැගී ඇත්නම් එම විෂමතා 96.08.30 වන දිනට පෙර පිටපත් හතරකින් යුතුව මා වෙත ලිඛිතව ඉදිරිපත් කරන මෙන් කොමිෂන් සභාවේ නියමය පරිදි මින් දන්වමි.

එසේ ලැබෙන නියෝජනයන් කොමිෂන් සභාව විසින් සලකා බලා විෂමතා ඉවත් කරමින් සංශෝධිත චක්‍රලේඛනයක් යථා කාලයේදී නිකුත් කිරීමට තීරණය කර ඇති බව ද වැඩිදුරටත් දන්වමි. පඩිපාලක සහා වැටුප් ක්‍රම අදාලව තිබූ යම්කිසි තනතුරකට හෝ ශ්‍රේණියකට ඉහත සඳහන් (අංක 2/96) චක්‍රලේඛනය අනුව සංශෝධිත වැටුප් ක්‍රම නියම කර නොමැති අවස්ථාවලදී 96.06.01 දින දක්වා ක්‍රියාත්මක වූ වැටුප් ක්‍රම මත එම තනතුරු දරන්නන්ට තවදුරටත් වැටුප් ගෙවන ලෙස ද දන්වමි. එම තනතුරු සඳහා සංශෝධිත වැටුප් ක්‍රම නියම කරනු ලැබුවාට පසුව එම වැටුප් ක්‍රම 96.06.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අනුමැතිය දෙනු ලබන බව ද වැඩිදුරටත් සැලකුව මැනවි.

(පී.ඩී. චන්ද්‍රදාස)
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාතේ සෞඛ්‍ය, සමුපකාර හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් -
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර් (බ.ප.)
3. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්, කළුතර, ගම්පහ, කොළඹ.